# තනි තටුවෙන් පියෑඹීම

දේශපාලන, ආර්ථික යටත් විජිතවාදවලට ද වඩා සංස්කෘතික යටත් විජිතවාදය භයානක ය. සමස්තයක් ලෙස ගත් කල දැනුම, එනම් මානව ශාස්ත්‍ර, විද්‍යාව, කලාව, දර්ශනය, ආදී වශයෙන් ඇති දැනුම, අද අප පෙළන ප්‍රධාන ම ආයුධය බවට පත් වී ඇත. නැතහොත් පත් කෙරී ඇත. අප විසින් අපේ දැනුමක් නිර්මානය කෙරෙනතාක් මේ දැනුම් ආධිපත්‍යයෙහි ග්‍රහණයට අපි හසු වී සිටින්නෙමු. දේශපාලන හා ආර්ථික යටත්විජිතවාදවල මධ්‍යස්ථාන හඳුනාගැනීම පහසුය. ධවල මන්දිරය, ඇමරිකන් කොන්ග්‍රසය, පෙන්ටගනය, බ්‍රිතානි පාර්ලිමේන්තුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ආදී වශයෙන් ඒ මධ්‍යස්ථාන කාහටත් දැකගත හැකිය. එහෙත් සංස්කෘතික යටත් විජිතවාදී මධ්‍යස්ථාන වූ ඔක්ස්ෆඩ්, කේම්බ්‍රිජ්, හාවර්ඩ්, ප්‍රින්ස්ටන්, සෝබෝන් ආදී සරසවි, සී. එන්. එන්., බී. බී. සී. වැනි ජනමාධ්‍ය ආයතන, සිනමා, සාහිත්‍ය කෘතිවලට බුකර් වැනි ත්‍යාග පිරිනමන ඊනියා ජාත්‍යන්තර ආයතන, ආදිය අපට එලෙස නොපෙනෙයි. අපට බටහිර දැනුම යන්න සංස්කෘතියෙන් ස්වායත්ත වූ ද වාස්තවික වූ ද දෙයක් ලෙස උගන්වා ඇත. එසේ උගන්වනු ලැබ ඇත්තේ ද බටහිරයන් විසින් මය. අප රටවල දැනුම ස්ථානගත සාම්ප්‍රදායික විශේෂිත වූ දැනුමක් ලෙස ඉගැන්වෙන අතර බටහිරයන්ගේ දැනුම පොදු දැනුමක් ලෙස ඉගැන්වෙයි. අද මෙරට විශ්ව විද්‍යාලවල ඉගැන්වෙන දැනුම කාගේ දැනුමක් ද යන ප්‍රශ්නයවත් අති මහත් බහුතරය නොඅසති. ඒ ප්‍රශ්නය අසන්නන් ඇතැම් කථිකාචාර්යවරයකුට පෙනෙන්නේ පිස්සන් ලෙසය. මේ කථිකාචාර්යවරයා බෞද්ධ සාපේක්ෂතාව තබා අඩු තරමින් තමන් වැන්නන් මහත් ගෞරවයකින් සලකන මිෂෙල් ෆුකෝ, මානසික රෝගීන් ගැන කියා ඇති දෙයවත් කියවා නැති බව පැහැදිලිය. පිස්සා යනු කවුදැයි අර්ථ දක්වන්නේ ද අධිපතිවාදී සංස්කෘතිය විසිනි. වාස්තවික පිස්සන් ලෝකයේ නොමැති බවත් පිස්සන් ද යම් සංස්කෘතියකට සාපේක්ෂ ලෙස අර්ථ දැක්වෙන බවත් මොහු කවදා තේරුම් ගනීද? අප නිදහස් වීමට නම් දැනුම ද සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය කෙරෙන්නක් බව පළමුව ඉගෙනගත යුතුය.

බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙන් කෙරෙන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය බලහත්කාරයෙන්, උපක්‍රමශීලීව, ක්‍රිස්තියානි ආගම පැතිරවීමෙන් ආදී ක්‍රම රාශියකින් අනෙක් රටවල් මත පැටවීමය. අධ්‍යාපනය, විද්‍යාව, කලාව ආදිය ද එහි දී යොදා ගැනෙයි. බටහිර සංස්කෘතික යටත්විජිතවාදය අපට යමක් බටහිර සංස්කෘතියෙන් අවශෝෂණය කර ගැනීමට ඉඩ නොදෙයි. බටහිරයෝ ඔවුනගේ සංස්කෘතිය අනුකරණය කිරීමට අපට විවිධ ක්‍රම මගින් උගන්වති. බටහිර දැනුම වාස්තවික යැයි කී විට, එය අවශෝෂණය කර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනගියි. අපේ රටවල සංස්කෘතීන් හැකි නම් නැති කර, අඩුම තරමින් දුර්වල කර, බටහිරයන්ගේ සංස්කෘතික ආධිපත්‍යය අප මත පැටවීම කුමන්ත්‍රණයක් නොවේ. එවැනි කුමන්ත්‍රණයක් මෙහි නැත. සංස්කෘතික ආධිපත්‍යය පැතිරවීම ඇතැම් විට සවිඥානික ව කෙරෙන අතර, ඇතැම් විටෙක අවිඥානිකව කෙරෙයි. බටහිර විශ්ව විද්‍යාලයක සාහිත්‍ය විචාරය උගන්වන කථිකාචාර්යවරයා කරන්නේ එහි ඉගෙන ගන්නා බටහිර මෙන්ම ආසියා අප්‍රිකා රටවල සිසු සිසුවියනට ද බටහිර සාහිත්‍ය විචාරය සංස්කෘතියෙන් ස්වායත්ත ව ගෙන ඉගැන්වීමය. ඒ දැනුවත් ව බටහිර සංස්කෘතික ආධිපත්‍යය අනෙක් රටවලට පැටවීමක් නොවේ. එහෙත් අවිඥානිකව කෙරෙන්නේ එයයි.

බටහිර රටකින් පශ්චාත් උපාධියක් ලබාගෙන පැමිණෙන සිංහලයකුට මෙරට සමාජයෙහි වැදගත් තැනක් ලැබෙන්නේත් වඩා දැනුමක් ඇති පණ්ඩිත භිකෂුව වහන්සේ නමකට එවැනි තැනක් නොලැබෙන්නේත් අවිඥානිකව මෙන්ම සවිඥානිකව ද කෙරෙන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙසය. අද සමාජයේ සමාජ වැදගත්කම තීරණය කෙරෙන්නේ බටහිරට අවශ්‍ය අන්දමටය. බටහිරයන් විසින් තම උපාධි, ත්‍යාග, සම්මාන හරහා ඇති කෙරෙන ඊනියා සම්භාව්‍ය පුද්ගලයෝ සමස්තයක් ලෙස ගත්කල බටහිරයන්ට අවශ්‍ය අන්දමට සවිඥානිකව හෝ අවිඥානික ව හෝ බටහිර සංස්කෘතික ආධිපත්‍ය පැතිරවීමේ කාර්යයෙහි නිරත වෙති. උපාධි, ත්‍යාග නැතත් බටහිර මතවාද ප්‍රචාරය කරන්නන්ට සමාජයෙහි යම් ප්‍රභූ තත්ත්වයක අත්වෙයි. මට ද මේ සමාජයෙහි යම් වැදගත් තැනක් හිමි වන බව මම දනිමි. ඒ මා බටහිර මතවාද ප්‍රචාරය කරන නිසා නොවේ. ඒ තත්ත්වය මට ලැබුණේ එංගලන්තයේ විශ්වවිද්‍යාලයකින් ලත් පශ්චාත් උපාධියක් හේතුකොටගෙනය. එසේ නොවන්නට මුල දී මා කී කිසිවක් කිසිවකුට වැදගත් නොවන්නට තිබුණි. උපාධිය ලබා ගැනීමෙන් අවුරුදු තිස් තුනකට පමණ පසුවත් ඒ විශ්ව විද්‍යාලය සමග

© Prof. Nalin De Silva

මට තවමත් කිට්ටු සම්බන්ධයක් ඇත. එහෙත් ඒ උපාධිය දීමෙන් ඔවුන් කරගත් මෝඩකම ගැන ඔවුන්ට තවමත් අවබෝධයක් නැත.

අශෝක හඳගම වැන්නන් කරන්නේ මෙරට සංස්කෘතිය දුර්වල කිරීමය. ඔහු වැන්නන් අවසාන වශයෙන් කරන්නේ බුෂ්ගේ අණ පිළිපැදීමය. බුෂ් ඔහුට දැනුවත්ව අණක් දී නොමැති බව පැහැදිලිය. එහෙත් බටහිර සංස්කෘතික, දේශපාලන, ආර්ථික යටත්විජිතවාදයේ ප්‍රධාන අණ දෙන්නා වූ බුෂ් පොදුවේ දී ඇති අණක් වෙයි. මාක්ස්වාදීන්ට, පශ්චාත් නූතනවාදීන්ට ආදී නොයෙකුත් වර්ගවල බටහිරවාදීන්ට කුමක් තේරුම් ගත්ත ද සංස්කෘතික යටත්විජිත වාදය තේරුම් ගැනීමට නොහැකිය. ඒ ඔවුන් ද බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ ඒජන්තයින් වන බැවිනි. පශ්චාත් නූතනවාදයට හා තමාගේ සාහිත්‍ය විචාරයට වාදයක් නැතැයි බුෂ් අණ පිළිපදින තවත් තැනැත්තකු වූ සමන් වික්‍රමාරච්චි පවසා තිබුණි. වාදයක් නැත්තේ නැති මනස නැති මනසක බව නැති මනසෙන් අවබෝධ කරගත් විටය. මනස් ඇත්තන් සියල්ලන්ටම වාද ඇත. අපි පසුව වෙනත් ලිපියක ඒ ගැන විස්තරාත්මක ව කතා කරමු.

සංස්කෘතිය යනු වෙනස් නොවන දෙයක් නොවේ. මා බොහෝ විට සඳහන් කර ඇති ආකාරයට සංස්කෘතිය වෙනස් නොවන බව අනිත්‍ය ගැන කතා කරන සිංහල බෞද්ධයන්ට අමුතුවෙන් කිව යුතු නොවේ. ප්‍රශ්නය වනුයේ සංස්කෘතිය වෙනස් කරන්නේ කවුද යන්නය. ඉතා පැහැදිලි ව අද ආසියා අප්‍රිකා රටවල සංස්කෘතිය වෙනස් කරන්නෙ බටහිරයන්ය. ඔවුහු තමන්ට අවශ්‍ය ආකාරයට එය කරති. බටහිරයන් විසින් ලෝකය පුරා ගොඩනගා ඇති සංස්කෘතික ජාලය තුළ කලින් සඳහන් කළ ආකාරයට යම් යම් දේ ඇතැමුන් අතින් අවිඥානිකව සිදුවෙයි. පාසලේ හෝ විශ්වවිද්‍යාලයේ හෝ උගන්වන ගුරුවරයා යම් මතවාදයක් උගන්වන්නේ එය වාස්තවික වූවක් ලෙස සලකමිනි. අප පාලනය කිරීමට යොදා ගන්නා වඩාත්ම භයානක වචන දෙක වන්නේ වාස්තවික යථාර්ථය යන්නය. මනසින් තොරව වාස්තවික යථාර්ථයක් තිබෙන බව කිසිවකුටවත් මනසින් තොරව පෙන්වා දිය

නොහැකිය. එක්ස් කණ්ඩායම සඟරා කඩ මාල්ලක ඔවුන් මනසින් තොරව වාස්තවික යථාර්ථයක් තිබෙන බව පෙන්වීමට ඔවුන්ට සුපුරුදු ආකාරයට බාල තැතක් දරා ඇත. ඉන් පෙන්වන්නේ ඔවුන්ගේ මුග්ධකම හා අඳබාලකම මිස වෙනත් දෙයක් නොවේ. ඇතැම් සිසුවෙක් ගණනක් සාදා එය නිවැරදි යැයි සිතයි. එහෙත් එය සාදා ඇත්තේ වැරදියට බව පරීක්ෂකවරයා දනියි. එක්ස් කණ්ඩාම ද එවැනි සිසුන් වැනිය. ඒ පිළිබඳවද පසු ලිපියකින් කතා කරමු.

වාස්තවික යථාර්ථය යනු ගජ බින්නය අපට ගිල්වා බටහිරයෝ ඔවුන්ගේ දැනුම වාස්තවික යථාර්ථය යැයි කියති. ඒ දැනුම එලෙස උගන්වන සියල්ලෝම බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ හවුල්කරුවෝ වෙති. ඔවුන් තමන් හවුල්කරුවන් බව නොදන්නවා විය හැකිය. එහෙත් ඔවුන් ඉටු කරන්නේ බටහිරයන්ට අවශ්‍ය කාර්යය වේ. වාස්තවික යථාර්ථයකට මුවා වී කරන සෑම කටයුත්තක්ම පාහේ මෙරට සංස්කෘතිය බටහිරට අවශ්‍ය ආකාරයට වෙනස් කිරීම සඳහා කෙරෙන දෙයකි.

අප එදා කොණ්ඩය කැපුවේ බටහිරයන් අනුකරණය කිරීමෙනි. අද ඇතැමුන් කොණ්ඩය වවනුයේද බටහිර විලාසිතා අනුකරණය කිරීමෙනි. පුරුෂාධිපත්‍යය පිළිබඳ කතාවද එබඳුය. යුරෝපීයයන් මෙරට ඒමට පෙර අද කතා කරන අන්දමේ පුරුෂාධිපත්‍යයක් මෙරට නොතිබුණි. ගැහැණු පිරිමි යනු දෙවර්ගයක් මිස එක වර්ගයක් නොවේ. පොදුවේ ගත්කළ ගැහැණු මනස පිරිමි මනසින් වෙනස්ය. අවශ්‍ය නම් බටහිරයන්ම කරන ලද අධ්‍යයන ඒ සඳහා ඉදිරිපත් කළ හැකිය. එහෙත් අපට ඒ අවශ්‍ය නොවේ. අප එකිනෙකාගේ වත්මන් මනස් සංස්කෘතිය, ජෛවීය ලකෂණ මෙන්ම සංසාරික පුරුදුද පදනම කරගෙන නිර්මාණය වෙයි. ගැහැණු-පිරිමි යනුවෙන් වර්ග දෙකක් ඇතැයි යන්නෙන් එක් වර්ගයක් අනෙක් වර්ගයෙන් පහත් කිරීමක් සිදු නොවේ. අනෙක් අතට සියල්ලෝම අඩු වැඩි වශයෙන් ගැහැණු හා පිරිමි ගති ඇත්තෝ වෙති. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් කිරීමට මේ ලිපියෙහි ඉඩක් නැත. බටහිරයන් විසින් අපට පුරුදු කරන ලද පුරුෂාධිපත්‍යය අද අප නැති කර ගැනීමට යන්නේද බටහිර ඇතැමුන් අනුකරණය කරමින්ය. අද බටහිර ගැහැණුන් බටහිර පුරුෂාධිපත්‍යයෙන් මිදීමට උත්සාහ කරන්නේ බටහිරයන්ටම සුපුරුදු ආකාරයටය. බටහිර ගැහැණු විමුක්තිය බලාපොරොත්තු වන්නේ බටහිර පිරිමින් මෙන් සමාජයේ ජීවත්වීමට උත්සාහ කිරීමෙනි. මේ ගැහැණු තමන් කරන්නේ කුමක්ද කියාවත් නොදනිති. පිරිමින් මෙන් ජීවත් වීමට උත්සාහ කිරීමෙන් ඔවුන් බටහිර පුරුෂාධිපත්‍යය පිළිගනිති. තමන්ගේම වූ දැනුමක් නිර්මාණය නොකරන මේ ගැහැණු බටහිර පිරිමින් විසින් නිර්මාණය

© Prof. Nalin De Silva

කෙරෙන දැනුම මතම රැඳෙති. බටහිර දැනුම් ආධිපත්‍යය පිළිගෙන තමන්ට ඒ දැනුම ඇතැයි කීමට පොර කන කල්ලන් හා මේ ගැහැණුන් අතර වෙනසක් නැත. අශෝක හඳගම සිනමාවට නගන ගැහැණියද බටහිර පිරිමියකු මෙන් ජීවත්වීමට උත්සාහ කරන්නියකි. මෙයින් හඳගම නොදැනුවත්මව කියන දෙයක් වෙයි. මෙරට පුරුෂාධිපත්‍යය යනු බටහිර පුරුෂාධිපත්‍යයකි. හඳගමගේ ගැහැණිය සිංහල බෞද්ධ පිරිමියකු මෙන් ජීවත්වීමට උත්සාහ නොකරයි. සිංහල බෞද්ධ පිරිමින් ඉන්නේ කොහේදැයි යම් අයකුට ප්‍රශ්නයක් වේ නම් එයට පිළිතුරු දිය හැකිය. බටහිර සංස්කෘතික ආධිපත්‍යය තුළ කරවටක් ගිලී ඇති විටෙකද මෙරට තවමත් එවැන්නෝ සිටිති.

තනි තටුවෙන් පියාඹන්න යන්න සිංහල දෙබස් සහිත වුවද බටහිර චිත්‍රපටයකි. හඳගම තමාට දේශසීමා නැතැයි පවසන විට ඉන් කියන්නේ ඔහුගේ දේශසිමාව බටහිර සීමාව බවය. ඒ, එම සීමා අද සම්මතය බවට බටහිර සංස්කෘතික ආධිපත්‍යය විසින් පත්කෙරී ඇති බැවිනි. බටහිර කලා කෘතියක් යනු ජාතක කතාවක් නොවේ. මාර්ටින් වික්‍රමසිංහ මහතාද නොහඳුනාගත් හෝ හඳුනාගැනීම මගහැරී හෝ කරුණු මෙයයි. ජාතක කතාවල ඇත්තේ සංයුක්ත විශේෂිත චරිතය. එහෙත් බටහිර කෙටි කතා හා නවකතාද ඇතුළු කලා කෘතිවල ඇත්තේ වියුක්ත පොදු චරිතය. බටහිර කලාව විශේෂිතයෙන් සාමාන්‍ය- කරණයට යයි. ඒ සමග ඇතිවන ප්‍රශ්නද වෙයි. මෙය හඳගම ඇතුළු ඊනියා ප්‍රබුද්ධයන්ගේ කලා කෘති හරහා ද සිදුවෙයි. දැන් ප්‍රශ්නය වනුයේ හඳගමගේ ගැහැණිය මෙරට පොදු ගැහැණියක්ද යන්නය. සුදු පිරිමින් මෙන් ජීවත්වීමට අවශ්‍ය සිංහල ගැහැණු මෙරට දාහකට දශමයක්වත් ඇතැයි නොසිතමි. හඳගමගේ කලින් චිත්‍රපටයකද හමුදාව ගැන එවැනි පොදුකාරණයක් කෙරී තිබිණි යැයි ඒ චිත්‍රපටය නැරඹූ කිහිපදෙනෙක්ම මා සමග කීහ. මෙතුළින් හඳගම වැන්නෝ සිංහලයන් ගැන වැරදි අවබෝධයක් ලෝකයට දෙති. බටහිරයන් ඒ වැරදි බව නොදන්නවාද නොවේ. මේ කර්තව්‍යය හඳගම වැන්නන් අතින් සිදුවන විට සංස්කෘතික අධිපතිවාදීහු ඔවුන්ට තෑගි දෙති.

මෙහි තවත් පැත්තක්ද වෙයි. කලා කෘති ඇත්තේ පණිවුඩදීම සඳහා නොවේ යැයි බටහිරයන් ඔවුන්ගේ හෙංචයියන් උගුර කඩාගෙන කීවද ඕනෑම කලා කෘතියකින් පණිවුඩයක් අවිඥානිකව හෝ ලැබෙයි. බටහිරන්ට අවශ්‍ය කලා කෘති මගින් අපට අවශ්‍ය පණිවුඩදීම වැළැක්වීමය. ඒ නැවැත්වූ විගස ඔවුන්ට අවශ්‍ය පණිවුඩ බාධාවකින් තොරව ගලා යයි. පියදාස සිරිසේන මහතාගේ කෘති බටහිර රාමුවක් තුළ විවේචනය කිරීමෙන් සරත්චන්ද්‍ර මහතා අප රටට කරන ලද හානිය විශාලය. ඒ මහතා අතින් පසුව විවේචනයට ලක්වූ ධර්මිෂ්ඨ සමාජය බිහිකිරීම ඒ මහතා හඳුන්වා දුන් සාහිත්‍ය විචාරය කෙතරම් දායකවීද යන්න කතා කළ යුතු මාතෘකාවක් වෙයි. දැනුම සම්බන්ධයෙන් ගත් කළ බටහිර දැනුම වාස්තවිකය යන්න අපට බොහෝ විට අවිඥානිකව ලැබෙන පණිවුඩයකි. හඳගමගේ චිත්‍රපටයෙන් සිංහල තරුණියන්ට ලැබෙන පණිවුඩය කුමක්ද? මේ චිත්‍රපටය නරඹන බොහෝ සිංහල තරුණියන්ට බටහිර සංස්කෘතික ආධිපත්‍ය ගැන හෝ බටහිර සුදු පිරිමින්ගේ පුරුෂාධිපත්‍යය ගැන හෝ කිසිදු වැටහීමක් නැත. ඔවුන්ට ලැබෙන පණිවුඩය නම් මෙරට සිංහල පිරිමි ආධිපත්‍යයක් ඇති බවත්, එය ජය ගැනීමට සිගරට් උරන, වේග මෝටර් රථ පදවන තරුණියක් විය යුතුය යන්නය. අද ඇතැම් පළාත්වල බාලිකා පාසල් අසළ පාසල අවසන් වන විට සිගරට් උරන තරුණයන් යොදවන බවට වාර්තා වී ඇත. මේ අය බාලිකාවනට දෙන පණිවුඩය කුමක්ද? හඳගම හා දුම්කොළ සමාගම අතර ඇති වෙනස කුමක්දැ? හඳගමත්, දුම්කොළ සමාගමත් බටහිර සංස්කෘතික ආධිපත්‍ය පතුරුවයි. ඒ වෙනුවෙන් ලාභ ප්‍රයෝජන තෑගි භෝග ලබාගනියි.

කෙතෙක් පුරුෂාධිපත්‍යය ගැන කතා කළ ද මේ චිත්‍රපටයෙන් මතුවන්නේ අනෝමා ජිනාදරී නොව අශෝක හඳගමය. අනෝමා ජිනාදරී මතු කරන චිත්‍රපටි මේ ඊනියා පුරුෂාධිපත්‍යය විරෝධියා අතින් නිර්මාණය නොවේ. හඳගම පුරුෂාධිපත්‍යය විරෝධියකු යැයි ඇතැමුන් සිතුව ද ඔහු එසේ නොවනවා විය හැකිය. එබැවින් ඒ පිළිබඳ විනිශ්චයක් දීමට මම ඉක්මන් නොවෙමි. අවසාන වශයෙන් නිෂ්පාදක සන්නස්ගල ගැනද වචනයක් කිව යුතුය. ඔහු මට අවසන් වරට මුණ ගැසුණේ ඔහුගේ සියාගේ සොහොයුරකු වූ ආචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල මහතාගේ අවමගුලේදීය. උපුල් ශාන්ත සන්නස්ගල සංකේතවත් කරන්නේ පුංචි බණ්ඩාර සන්නස්ගල වියතාණන්ගේ මරණයයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva